**ශීර්ෂය- 296 -ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය- 296 ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූනි 13 දින ගණන් දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කිසියම් නිශ්චිත ව්‍යාපෘතියක සෘජුවම ප්‍රයෝජනයට ගැනීම සඳහා ද්‍රව්‍ය හා උපකරණ වශයෙන් විදේශ ප්‍රාග්ධන ආධාර ලැබූ කල්හි එම අයිතමයන්ට අදාළ ලිපි ලේඛනවල තොරතුරු පදනම් කරගෙන එකී ප්‍රදානයේ රුපියල් වටිනාකම දෙපාර්තමේන්තුව විසින් නිශ්චිත කළ යුතු අතර එකී අගය යථාර්තවාදී නොවන අවස්ථාවල දී එය විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් ලබාගෙන ඇස්තමේන්තු ගත අගයක් ගණනය කර ගිණුම් ගත කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී ඇමරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය යටතේ ප්‍රදානයක් වශයෙන් ලැබී තිබුණු ඇ.එ.ජ.ඩොලර් 280,000 ක් පමණ වටිනා ආනයන බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතිය සහ ඊට අදාල ඇ.එ.ජ. ඩොලර් 19,100 ක් වටිනා පරිගණක ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඇමරිකානු එක්සත් ජනපද තානාපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක EXBS වැඩසටහන මගින් දෙපාර්තමේන්තුව වෙත ප්‍රදානයක් වශයෙන් ලැබුණු පද්ධතියෙහි වැඩි දියුණු කිරීම්වලට අදාල මූලික කටයුතු අවසන් වූයේ 2024 මාර්තු මාසයේ දීය. එම ප්‍රදානය පරිගණක පද්ධති වැඩිදියුණු කිරීම් හා ඊට අදාල පරිගණක දෘඩාංගවලින් සමන්විතය. මෙම ප්‍රදානයෙහි අවසන් මූල්‍ය වටිනාකම නිවැරදිව ගිණුම්ගත කිරීම සඳහා හැකියාව ලැබෙනුයේ මේ වන විටත් සිදු කර ගෙන යනු ලබන වැඩිදියුණු කිරීම් අවසන් වූ පසුව හා ඊට අදාළ දෘඩාංග දෙපාර්තමේන්තුවට භාර දීමෙන් අනතුරුවය. එම කටයුතු සම්පූර්ණ වීමෙන් පසු එම ව්‍යාපෘතියෙහි සත්‍ය වටිනාකම ගණනය කළ හැකි වන අතර එම අගය ගිණුම්ගත කිරීම සඳහා සටහන් කර ගෙන ඇත. | ප්‍රදානයේ වටිනාකම නිශ්චය කර ගිණුම්ගත කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී බලපත්‍ර ආදායම් සඳහා මූලික ඇස්තමේන්තුව රු.2,600,000,000 ක් වූ අතර සංශෝධිත ඇස්තමේන්තුව රු.2,900,000,000ක් වීමෙන් රු.300,000,000 ක විචලතාවයක් නිරීක්ෂණය වූ අතර එය මූලික ඇස්තමේන්තුවෙන් සියයට 12 ක විචලතාවයකි. එබැවින් මූලික ඇස්තමේන්තු සකස් කිරීමේදී හැකිතාක් නිවැරදිව ඇස්තමේන්තු පුරෝකථනය කිරීමේ අවශ්‍යතාව විගණනයේදී නිරීක්ෂණය කෙරේ. | මූලික ඇස්තමේන්තුව සකස් කරන අවස්ථාවේ දී පැවති විදේශ විනිමය තත්ත්වයන් මත 2023 වර්ෂය සඳහා ආදායම් ඇස්තමේන්තු සකස් කරන ලද අතර වර්ෂය මැද වන විට පැවති විදේශ විනිමය තත්ත්වයන් සලකා බැලීමෙන් අනතුරුව ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කිරීම හේතුවෙන් මෙම විචලතාවය ඇති වී ඇත. | මූලික ඇස්තමේන්තු සකස් කිරීමේදී හැකිතාක් නිවැරදිව ඇස්තමේන්තු පුරෝකථනය කළයුතු බව |

### 2.2 වියදම් කළමනාකරණය

#### 2.2.1 පුනරාවර්තන වියදම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම්හි වැය විෂයයන් 10 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 සිට සියයට 81 ක් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීමක් විය. | ඔබගේ නිරීක්ෂණයන් හා එකඟ වේ. | වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේ දි, හැකිතාක් දුරට නිවැරදිව සහ සකසුරුවම්ව සකස් කළයුතු බව. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වැය විෂයයන් 07 ක මූලික ඇස්තමේන්තු හා සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර සියයට 22 සිට සියයට 37 ක් දක්වා වූ පරාසයක විචලතාවයක් විය. ඒ අනුව මූලික ඇස්තමේන්තු සකස් කිරීමේදී පසුගිය වර්ෂයන්හි වියදම් පිළිබඳ සමාලෝචනයක් සිදු කර හැකිතාක් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පුරෝකථනය කිරීමේ අවශ්‍යතාවය විගණනයේදී අවධාරණය කෙරේ. | දක්වා ඇති වටිනාකම් හා ප්‍රතිශතයන් හා එකඟ වේ. | -එම- |

### 2.2.2 මූලධන වියදම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා වූ මූලධන වැය විෂයයන් දෙකක මූලික ඇස්තමේන්තු හා සංශෝධිත ඇස්තමේන්තු අතර විචලතාවය සියයට 86 ක් සහ සියයට 363 ක් බැගින් විය. ඒ අනුව මූලික ඇස්තමේන්තු සකස් කිරීමේදී හැකිතාක් නිවැරදිව වියදම් පුරෝකථනය කිරීමට කටයුතු කර නොතිබුණි. | දක්වා ඇති වටිනාකම් හා ප්‍රතිශතයන් හා එකඟ වේ. | වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේදී හැකිතාක් නිවැරදිව ඇස්තමේන්තු පුරෝකථනය කළයුතු බව. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා වූ මූලධන වැය විෂයයන් 05 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 සිට සියයට 63 ක් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීමක් විය. | දක්වා ඇති වටිනාකම් හා ප්‍රතිශතයන් හා එකඟ වේ. | -එම- |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4:5 උප වගන්තිය<br>. | 1,267,199 | සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු වර්ෂ 01 සිට 03 දක්වා පැරණි ණය ශේෂය රු.223,269 ක් ද, අවුරුදු 1ට අඩු රු.470,177 ක ණය ශේෂයක් ද විය. තවද, වැඩ තහනම් කළ නිලධාරීන්ගේ ණය ශේෂ ලෙස වර්ෂ 05 ට වඩා පැරණි රු.335,753 ක ශේෂයක් ද, වර්ෂ 01 සිට 03 දක්වා පැරණි රු.238,000 ක ණය ශේෂයක් ද විය. යොමුගත වගන්තිය ප්‍රකාරව එම | 2023.08.14 දින සිට සේවයෙන් පහ කරන ලද කළමනාකරණ සේවා නිලධාරිවරයාගේ දේපළ ණය ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා මෙන් ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය වෙත 2023.09.08 දිනැතිව ලිපියකින් දන්වන ලදි. 2022.03.30 දින සිට තනතුර අතහැර | ආයතන සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළයුතු බව |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිය කා.සේ.සේ. ගෙන් අයවිය යුතු රු. 223,269 ක ආපදා ණය අයකර ගැනීම සඳහා ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ නීති උපදෙස් ලබා ගැනීම සඳහා ද රු.470,177 ක ණය අයකර ගැනීම සඳහා ඔහුගේ ඇපකරුවන් වෙත ද දන්වා ඇත. | |
| (ii) | 2022 අප්‍රේල් 04 දිනැති අංක 5/2022 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | 3,038,690 | රජයේ දේපල අස්ථානගතවීම සහ අවභාවිතය වැළැක්වීම මෙන්ම ඒවා උපරිම ඵලදායීභාවයෙන් ප්‍රයෝජනයට ගැනීම තහවුරු කිරීමට ආයතන ප්‍රධානීන්ට නියම කර තිබියදී, එයට පටහැනිව රු.3,038,690 ක පිරිවැයක් සහිත N1SSAN SYLPHY වර්ගයේ මෝටර් රථය ආයතන අතර විධිමත් වත්කම් හුවමාරුවක් සිදු නොකර 2022 දෙසැම්බර් 05 දින ජනාධිපති ලේකම් කාර්යාලය වෙත භාර දී තිබුණි. | මෙම රථය තාවකාලික අන්දමින් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත භාර දී ඇත. | චක්‍රලේඛයේ විධි විධාන ප්‍රකාර කටයුතු කළයුතු බව |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 දැක්ම හා මෙහෙවර**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1969 ජනවාරි 16 දිනැති අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතින් පිහිටුවන ලද දෙපාර්තමේන්තුවේ අරමුණ, දැක්ම හා මෙහෙවර අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට අහිතකර ලෙස බලපාන ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වුවත් එක් එක් විෂයයන්ට | මෙම දෙපාර්තමේන්තුවේ අරමුණු, දැක්ම හා මෙහෙවර අනුව ආර්ථිකයට අහිතකර ලෙස බලපාන ආනයන හා අපනයන පාලනය මෙන් ම රටේ ආරක්ෂාව, මහජන සෞඛ්‍ය හා පරිසර සංරක්ෂණයට අහිතකර ලෙස බලපාන ආනයන හා අපනයන පාලනය ද අදාළ වේ. | 1969 ජනවාරි 16 දිනැති අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණු, දැක්ම, හා මෙහෙවර අනුව අහිතකර ආනයන හා |

| | | |
|---|---|---|
| අදාලව රජයේ ආයතන විසින් නිකුත් කරනු ලබන නිර්දේශ මත පදනම්ව පමණක් ආනයන බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර තිබුණි. තවද, දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කිරීම සඳහා පිළිගත් විද්‍යාත්මක ක්‍රමවේදයක් හෝ ක්‍රියාපටිපාටියක් සකස් කර නොතිබුණු අතර බලපත්‍ර ගාස්තු අයකිරීම ප්‍රධාන කාර්යය ලෙස සළකා කටයුතු කරමින් රටෙහි සමස්ථ පාරිභෝජනයෙහි පුරෝකථනයන් සිදු කර ප්‍රමාණ පාලනය (Quantity Control) නොකරන බව නිරීක්ෂණය විය. | ඒ අනුව ඉහත කරුණු සඳහා බලපෑමක් ඇති විය හැකි භාණ්ඩ ආනයනය පාලනය සඳහා එම විෂයය පිළිබඳ ව විශේෂඥ දැනුමක් සහ ඒ සමඟ සෘජු ව සම්බන්ධ වන ආයතන එකකින් හෝ කිහිපයකින් නිර්දේශ ලබා ගෙන ආනයන බලපත්‍ර නිකුත් කරනු ලබන අතර එම නිර්දේශ ලබා දීමේ දී ඔවුන් අනුගමනය කරනු ලබන ක්‍රමවේදයන් හා නිර්ණායක පිළිබඳව සම්බන්ධීකරණයක් මෙම දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබයි. | අපනයනයන් පාලනය කිරීමට කටයුතු කළ යුතු බව. |

**3.2 දෙපාර්තමේන්තුවේ වගකීම හා කාර්යභාරය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අපනයන පාලනයට අදාළ රෙගුලාසි ඇතුළත් ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කිරීම ද දෙපාර්තමේන්තුවේ වගකීම් සහ කාර්ය භාරයන් වශයෙන් දැක්වුවද, ආනයන පාලනයට අදාළ කාර්යයන්හි පමණක් නිරතවී තිබුණු අතර 2017 වසරෙන් පසුව අපනයනයන්ට අදාළ කිසිදු රෙගුලාසියක් නිකුත් කළ බවට විගණනයට නිරීක්ෂණය නොවුණි. | මෙම දෙපාර්තමේන්තුව භාණ්ඩ ආනයන හා අපනයන පාලනය මගින් මෙරට ආර්ථිකයට අහිතකර ලෙස බලපාන තත්ත්ව පාලනය මෙන්ම රටේ ආරක්ෂාව, මහජන සෞඛ්‍ය හා පරිසර සංරක්ෂණයට අහිතකර තත්ත්වයන් පාලනය කිරීම ද සිදු කරනු ලබයි. එහි දී වැඩි බලපෑමක් සිදු වන්නේ මෙරටට ආනයනය කරන භාණ්ඩ සම්බන්ධයෙන් වන බැවින් ආනයන පාලනය සඳහා වැඩි අවධානයක් යොමු කරනු ලබන අතර මෙරටින් අපනයනය කරන භාණ්ඩ වර්ග කිහිපයක් පමණක් අංක 2044/41 හා 2017.11.09 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයට අනුව අපනයන පාලනයට යටත් කර ඇත. | දෙපාර්තමේන්තුව පිහිටුවීමේ වගකීම් සහ කාර්ය භාරයන් නිසි පරිදි ළඟා කර ගැනීමට උනන්දු විය යුතු බව |

## 4. යහපාලනය

### 4.1 රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඵලදායී තොරතුරු තාක්ෂණික පද්ධතීන් උපයෝගී කර ගනිමින් රජයේ ආදායම එකතු කිරීම, වැඩිදියුණු කිරීම සඳහා පාර්ශවකරුවන් විසින් සහ පාර්ශවකරුවන් අතර ගත යුතු පියවර නිර්දේශ කිරීම සඳහා වූ 2016 නොවැම්බර් මස 23 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අතුරු වාර්තාවේ නියෝග පරිදි "ආයතන විසි අටක සම්බන්ධීකරණය ඇතිව, බලපත්‍ර නිකුත් කිරීමේදී අදාල ආයතන වෙතින් අන්තර්ජාලය ඔස්සේ නිර්දේශ ලිපි ලබා ගැනීමට සැලසුම් සකස් කළ යුතු බව" දන්වා තිබුණද එම නිර්දේශය විගණන දිනය වූ 2024 මාර්තු 31 දින වන විටත් ක්‍රියාත්මක වී නොතිබුණි. | නව බලපත්‍ර නිකුත් කිරීමේ පරිගණක පද්ධතිය සකස් කිරීමට අදාළව මෘදුකාංග සංවර්ධනය කිරීමේ මූලික කටයුතු 2024 මාර්තු මස අවසන් කර ඇති අතර එම පද්ධතිය තුළ නිර්දේශ ලබා දෙන ආයතන සියල්ල සම්බන්ධ කර ගැනීමට හැකි වන පරිදි අතුරු මුහුණත් නිර්මාණය කර ඇත. නව පද්ධතිය බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යය සඳහා යොදා ගන්නා තෙක් නිර්දේශිත ආයතන මගින් නිර්දේශ ලබා ගැනීමේ දී සෘජුවම විද්‍යුත් තැපැල මගින් නිර්දේශයන් දෙපාර්තමේන්තුව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කරනු ලබයි. | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අතුරු වාර්තාවේ නියෝගයන්ට අනුකූල විය යුතු බව |
| (ආ) | නිර්දේශිත කාලය ඉක්ම වූ වාහන සහ කොටස්කර ගෙන්වනු ලබන වාහන ආනයනය සඳහා ප්‍රතිපත්තියක් සකස් කරන ලෙස 2024 ජනවාරි 23 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබුණ ද, එවැනි ප්‍රතිපත්තියක් සකස්කර නොතිබුණු අතර ඖෂධ නිෂ්පාදනයට ගෙන්වන ස්ප්‍රිතු පිළිබඳ පසු විපරම් කරන ලෙස දැනුම් දී තිබුණ ද, එය ද ඉටුකර නොතිබුණි. | වාහන ආනයනය සඳහා වන ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම ජනාධිපති ලේකම් කාර්යාලය විසින් පත් කළ කමිටුවක් මගින් සිදු කර ගෙන යනු ලබන අතර එම වාර්තාව නිකුත් කිරීමෙන් පසුව ඊට අනුකූලව කටයුතු කිරීම සඳහා සටහන් කර ගෙන ඇත. | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝගයන්ට අනුකූල විය යුතු බව |
| (ඇ) | සි ෂෙල්ස් සිට තායිලන්තය දක්වා ගමන් කළ මත්ස්‍යයින් ගබඩා කළ බහාළුම් රැගත් නෞකාවක් කොළඹ වරායට ආසන්න මුහුදු ප්‍රදේශයේ දී කාර්මික දෝෂයකට ලක් වී විදුලි සැපයුම නතර වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ වරාය අධිකාරිය වෙත ළඟා වී තිබුණු අතර විදේශීය නෞකාවේ දේශීය නියෝජිතයා මගින් සොයාගත් දේශීය පෞද්ගලික ආයතනයකට | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දුන් උපදෙස් පරිදි මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ද නියෝජිතයකු ඇතුළත් වන පරිදි පත් කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ කමිටුව විසින් ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු 2024.03.25, 2024.04.29 හා 2024.04.30 යන දිනයන් හි දී සිදු | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝගයන්ට අනුකූල විය යුතු බව. |

දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ආනයන බලපත්‍රයක් මත කාබනික පොහොර නිෂ්පාදනය සඳහා මෙම මාළු බහාළුම් 2022 මාර්තු 09 වන දින විකුණා තිබීම පිළිබඳව 2024 ජනවාරි 23 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දී තිබුණු පහත සඳහන් නියෝගයන් දෙපාර්තමේන්තුව විසින් ඉටුකර නොතිබුණි.

- ඉවතලන මාළු කොටස් යොදාගෙන පොහොර නිෂ්පාදනය කිරීම සිදුකරනු ලබන අදාල ආයතනය විසින් මේ වන විට කොපමණ ප්‍රමාණයක පොහොර නිෂ්පාදනය කර තිබේද යන්න පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් ඉදිරිපත් කිරීම.

- කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදා නොගත් අප-මාළු (Fish-Waste) අඩංගු බහාලුම් 15 පිළිබඳව සොයා බලා අපහරණය සඳහා නිසි ක්‍රියාමාර්ග ගැනීම

කරන ලදි. එහිදී පරීක්ෂණයෙහි විස්තර සහිත වාර්තාව සකස් කරමින් පවතින අතර එම වාර්තාව ලද පසු ඔබ වෙත ඉදිරිපත් කිරීම සඳහා සටහන් කර ගෙන ඇත. එසේ ම කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදා නොගත් අප-මාළු අඩංගු බහාලුම් 15 සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ලද පසු ඉතා ඉක්මනින් අපහරණය කිරීම ආරම්භ කරන බව ද වැඩි දුරටත් දන්වා ඇත.